FHSS e Repository of Humanities and Social Sciences

Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව (E - Repository)
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ප්‍රකාශන පරිත්‍යාග කිරීමේ පත්‍රිකාව

කරුණාකර ඔබගේ ප්‍රකාශණය පිළිබඳ පහත තොරතුරු සපයන්න (ඔබගේ ප්‍රකාශන එකකට වඩා වැඩි ප්‍රමාණයක් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව වෙත ප්‍රදානය කරන්නේ නම්, එක් ප්‍රකාශනයක් සඳහා එක් කර්තෘ එකඟතා පත්‍රිකාවක් බැගින් සම්පූර්ණ කිරීමට කාරුණික වන්න).

1. ග්‍රන්ථ නාමය/මාතෘකාව : වැලි කතරෙහි කඳුළු
2. කර්තෘ ගේ නම 1 : ..........
3. කර්තෘ ගේ නම 2 : ..........
4. කර්තෘ ගේ නම 3 : ..........
5. කර්තෘ ගේ නම 4 : ..........
6. ප්‍රකාශකයා ගේ නම : ..........
7. ප්‍රකාශයට පත් වර්ෂය : 2013
8. ISBN /ISSN අංකය (ඇත් නම්) : 978-955-97333-1-7
9. විකල්ප ප්‍රවේශ අවස්ථාව (ඉල්ලීම් ලිපියේ දක්වා ඇති 1 සිට 6 දක්වා වන විකල්ප ප්‍රවේශ අවස්ථාවන්ගෙන් ඔබ තෝරාගත් විකල්පයේ අංකය සඳහන් කරන්න) : ☐

   * ඔබ 3 හෝ 4 වන විකල්පය තෝරා ඇත්නම්, අවසරය ලබා දෙන පිටු ගණන සඳහන් කරන්න.: ☐
10. ඔබගේ ප්‍රකාශනය අප වෙත ලබා දෙන ස්වරූපය (පහත එක් විකල්පක් තෝරන්න):
    a. ප්‍රකාශනයේ PDF පිටපතක් ලබා දෙමි : ☐
    b. මුල් ප්‍රකාශනයේ දෘඩ පිටපතක් (hard copy) ලබා දෙමි : ☑
    c. වෙනත් (කරුණාකර සඳහන් කරන්න) .......... : ☐

**කර්තෘ/ප්‍රකාශන හිමිකරු ගේ ප්‍රකාශය**

කොඩිකාර අංජලී චන්දිමා සිල්වා (ඔබගේ නම/නම්) වන මම/අපි, කර්තෘ/ප්‍රකාශන හිමිකරු(වන්) වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව (**E - Repository**) ට ඇතුලත් කිරීම සඳහා ඉහත ප්‍රකාශනය ලබා දීමට කැමැත්තෙමි/කැමැත්තෙමු. එසේම, එම ප්‍රකාශනය මා/අප විසින් ඉහතින් ලබා දී ඇති විකල්ප ප්‍රවේශ අවස්ථාව මඟින් පනවන ලද සීමාවන් වලට යටත්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ප්‍රවේශ හැකියාව ලබා දීමට ද එකඟ වන්නෙමු.

කර්තෘ/ප්‍රකාශන හිමිකරු(වන්) ගේ අත්සන/අත්සන්: 1) [signature] 2) .......... 3) ..........

දිනය: ..........



# වැලි කතරෙහි කඳුළු

අංජලී චන්ද්‍රිමා සිල්වා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි විෂය පිළිබඳ උපදේශිකාවක වන අංජලී චන්ද්‍රිමා සිල්වා මෙනෙවිය දැන් වසර කිහිපයක සිට සේවය කරන්නී ඕමාන් රාජ්‍යයේ ගුරුවරියක වශයෙනි. මෙරට සිටිය දී සිය ජීවන අත්දැකීම් අළලා සඳහිරු නිසලයි නමින් පද්‍ය කාව්‍ය එකතුවක් හා "Letters from the Soul" නමින් ඉංග්‍රීසි පද්‍ය කාව්‍ය සංග්‍රහයක්ද ලියා පළ කළ අංජලීගේ 'වැලි කතරෙහි කඳුළු' නමැති මෙකී කෘතියෙහි දක්නා ලැබෙන්නේ ඇය නොරට දී ලද අත්දැකීම් පාදක කරගෙන කළ නිර්මාණය. ඒ බොහෝ නිර්මාණවලින් ඇසෙන්නේ පාලු හුදෙකලා ස්වරයකැයි මට සිතේ. බුදුන්වහන්සේ ගැන, ගුරුවරුන් ගැන, සිසු සිසුවියන් ගැන රචනා කළ කවියක වුව ඒ ස්වරය ඇසිය හැකිය. අංජලී, සිංහල විශේෂවේදී උපාධිධාරිනියක මෙන්ම සිංහල පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියක ද වන බැවින් නිවැරදි රසවත් බස් වහරක් භාවිත කරන්නට ද ඇය සමත් වී සිටී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න
සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සී.ආර්.සී.මුද්‍රණාලය
නො. 119, විශ්වවිද්‍යාල පාර,
රත්තනපිටිය,
බොරලැස්ගමුව.

ISBN 978-955-97333-1-7
9 789559 733317

මිල රු. 200/-

# වැලි කතරෙහි කඳුළු



අංජලී චන්ද්‍රිමා සිල්වා

**කතෘගේ වෙනත් කෘති :**

| | |
|---|---|
| සඳ හිරු නිසලයි (ගී පද සරණිය) | 2001 |
| Letter from the soul (Poetry) | 2007 |

# වැලි කතරෙහි කඳුළු


## අංජලී චන්ද්‍රිමා සිල්වා

ශාස්ත්‍රවේදී (විශේෂ), ශාස්ත්‍රපති (සිංහල),
ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාද්
උපාධි ඩිප්ලෝමා
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



සී.ආර්.සී. මුද්‍රණාලය
නො. 119
විශ්වවිද්‍යාල පාර,
රත්තණපිටිය,
බොරලැස්ගමුව.

# වැලි කතරෙහි කඳුළු

(කාව්‍ය සංග්‍රහය)

© අංජලී චන්දිමා සිල්වා

පළමු මුද්‍රණය - 2013 ජූලි

සියලුම හිමිකම් කර්තෘ සතුය.

ISBN : 978 - 955 - 97333 - 1 - 7

කර්තෘ ප්‍රකාශනයකි.

කවර නිර්මාණය : නාලිනී කොඩිකාර

මුද්‍රණය : සී. ආර්. සී. මුද්‍රණාලය
නො. 119, විශ්ව විද්‍යාල පාර,
රත්තනපිටිය,
බොරලැස්ගමුව.

## අඤ්ජලී



ඕමානයේ ශ්‍රී ලංකා විදුහලේ විදුහල්පති
සෝමබන්ධු කොඩිකාර ගුරු පියාණන්ට
සහ නාලිනී කොඩිකාර ගුරු මෑණියන්ට...

බොහෝ කලකට පසුව
පන්හිඳ යළිත් මා
සුරතෙහි තබන්නට
ඔබ දැරූ
අපමණ වෙහෙසට
කෘතවේදී වන්නට
මේ වදන් පෙළ
නොසෑහෙන බව
දන්නා නමුත්,
ඔබ නමින්
හද ගැබෙහි
නිදන් වූ
සෙනෙහස...
භක්තිය...
ගෞරවය...
කෘතවේදීත්වය...
පුදන්නට අන් ලෙසක්
නොදන්නා හෙයින්
මේ ගත
කුසුමක් කොට
ඔබේ පාමුල
පුදමි බැතියෙන...

# කවියාගේ ලෝකය

ජීවිතය සුන්දර සිහිනයකැයි ඇතැම්මු පවසති.

එය අතිශයින් බියකරු අඳුරු අගාධයක් ලෙස සමහරු දකිති.

යථාර්ථවාදී ද්වන්ද්වාත්මක භෞතිකවාදියෙකුට එය රසායනික ක්‍රියාවලියක ඵලය වන අතර සර්ව සුභවාදියෙකුට ජීවිතය නියත ජය තහවුරු කළ තරංගයක් ලෙස පෙනෙනු ඇත.

කවියා යනු මේ සියල්ලේ සොඳුරු සංකලනයක් සේ දකිමි.

ජීවිතය ගෙන එන අනේක විධ දුක්ඛ දෝමනස්සයන්ට නොබියව මුහුණ දිය හැක්කෙකි, කවියා.

මක්නිසාද යත්, කවියා යථාර්ථය අභිභවා යන පරිකල්පන ශක්තියෙන් හෙබි අයෙකු හෙයිනි.

අංජලී චන්දිමා කිවිඳිය සිය 'වැලි කතරෙහි කඳුළු ' නම්, කෘතියෙන් කියා පාන්නේ නුහුරු ලෝකයක තනිවූ කාන්තාවකගේ ශෝකාලාපයයි. පරමාදර්ශී නොවන ලොවක ඇය පුන පුනා සොයන්නේ කේවල පරිපූර්ණත්වයයි.

එහිදී ඇයට බොහෝ විට හමුවන්නේ සිසිල් දිය දහරක් නොව, ගෝ කුරයක රැඳුණු පැන් පොදකි.

විල සහ ජල බඳුන, මලේ කතාව සහ ආත්මාවබෝධය වැනි අරුත්බර කවි පද වැල්වලින් මෙන්ම, අහෝ ඛේදයකි, අසුභවාදිනියක් දෝ මා, ජීවිතය ගීතයකි වැනි හැඟුම් බර කවි පංතීන් ගෙන්ද කෘතිය සමන්විත වෙයි.

දැනට ඕමානයේ මස්කට් නුවර ශ්‍රී ලංකා පාසලේ ආචාර්යවරියක වන අංජලී චන්දිමා මෙනෙවිය කිවිඳියක මෙන්ම මාධ්‍යවේදිනියක සහ ගීත රචකාවියක ද වෙයි. සිංහල මෙන්ම ඉංග්‍රීසි බසද ඉතා මැනවින් හැසිරවීමේ නිපුණතාවෙන් යුත් ඇය සිය ජීවිත අත්දැකීම් විඳ දරා ගැනීම සඳහා මෙවලමක් ලෙස කවිය යොදා ගන්නා බව පැහැදිලිය.

ඇය එතනින් ඔබ්බට ගොස් සිය භාව ප්‍රකාශන මාධ්‍යය වන කවිය, ජීවිතාවබෝධය කෙරෙහි එල්ල කරනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සෝමබන්ධු කොඩිකාර.**
විදුහල්පති,
ශ්‍රී ලංකා පාසැල
මස්කට් නුවර,
ඕමානය
07. 12. 2012



# උපකාරානුස්මෘති

මා ඕමානයේ ගත කළ වසර දෙකක කාලපරිච්ඡේදය මට අමතක නොවන මතක සටහන් රැසක් ඉතිරි කළ කාලපරිච්ඡේදයක් යැයි කිවහොත් නිවැරදි ය. මේ කාලය තුළ මිහිරි මතකයන් මෙන්ම අමිහිරි මතකයන් ද මගේ ජීවිතයට එක්වුණි. එහි ගත කළ කාලය එක්තරා සීමාවකට කොටු වී ගත කළ කාලයක් විය. පාසලටත් නවාතැනටත් සීමා වූ ජීවිතයක මතකයන් පෙළ ගස්වන්නට පන්හිඳ සුරතට පත්වූයේ මා වෙලාගත් පාළුව තනිකම නිසාමය. චිත්ත පීඩාවන් මග හරවා ගැනීමට මට පිහිට වූයේ මගේ ආරණීය පන්හිඳයි. එයට බොහෝ පින්.

මගේ ජීවිතයේ සුවිශේෂි සන්ධිස්ථානයක් වූයේ ඕමානයේ ශ්‍රී ලංකා පාසලයි. මා ගුරුවරියක ලෙස දැනට සේවය කරන එම පාසලේ විදුහල්පති සෝමබන්ධු කොඩිකාර මහතා සහ ඔහුගේ බිරිඳ වන නාලිනී කොඩිකාර මහත්මිය මා මෙතෙක් ආ කටුක දුර්ග මාර්ගයේදී මට හමුවූ බෝසත් ගුණෝපේත උතුමෝ වෙති. එම විදුහල්පතිතුමා නොසිටින්නට මා එම පාසලේ ගත කළ කාලය මාස කීපයකට සීමා වනු නොඅනුමානය. මා ලියන කවි කියවා ඒවා අගය කරමින් මා කෙරෙන් ගිලිහෙමින් තිබූ කවිකම් නැවත ඉස්මතු කරන්නට වෙර දැරූ ඔවුන් දෙපළට පින් පෙත් පුදන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.

දැඩි අවිවේකී බව හමුවේත් කියූ පමණින් මෙහි පසුවදන ලියා දීමට කැමැත්ත පළ කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යාපනාංශයේ ජ්‍යෙෂ්ඨ මාහාචාර්ය සුනිල් ආරියරත්න ඇදුරුතුමන්ට කෘතවේදී ප්‍රණාමය පුද කරමි. බොහෝ රාජකාරි කටයුතු මධ්‍යයේත් මෙයට පෙරවදනක් ලියා දීමට තරම් කාරුණික වූ ඕමානයේ ශ්‍රී ලංකා විදුහලේ විදුහල්පති සොමබන්ධු කොඩිකාර මහතාට හදපිරි භක්ති ප්‍රණාමය පුද කරමි.

මගේ ජීවන ගමනට නිබඳව අත්වැලක් වූ මගේ ආදරණීය පියාණන් සහ මෑණියන් මේ අවස්ථාවේ දී ගෞරව පූර්වකව සිහි කරමි.

මගේ අවිවේකීව ජීවිතයේ දී මට උපකාර කරමින් අත්වැල් සැපයූ මගේ නංගිටත්, මල්ලිටත්, මනෝජ් මලිල්ටත්, නවීෂා සුදු දුවටත් මගේ ආදර ගෞරවය හිමි වේ.

දැනට ජීවතුන් අතර නැතත් මා කිවිඳියක වනු දකින්නට රිසි වූ මගේ ආදරණීය සීයා ද මෙහි දී හද බැති පෙමින් සිහිපත් කරමි.

මගේ හැකියාවන් හැඳින ගෙන මට ඉදිරියට යන්නට ගමන් මග හෙළි කර දුන් මහාචාර්ය තිස්ස කාරියවසම්, පාර්වතී නාගසුන්දරම්, ආර්. එස්. කරුනාරත්න, ඔරානි ජෑන්ස් යන ඇදුරු පියවරුන් සහ මෑණිවරුන් කෘතවේදී හදින් සිහි කරමි.

පොතට පිටකවරයක් චිත්‍රණය කර දීමට ස්වකැමැත්තෙන් ඉදිරිපත් වූ චිත්‍ර ශිල්පිනියක ලෙස මෑත කාලයේ දෙස් විදෙස් බොහෝ දෙනාගේ සම්භාවනාවට පාත්‍ර වූ නාලිනී කොඩිකාර මහත්මියට ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි.

මෙය තමාගේ කාර්යයක් සේ සලකා මනා සැකසුමකින් යුක්තව මේ පොත් පිංච මා අතට පත් කිරීමේ කාර්යය ඉටු කර දුන් සී. ආර්. සී ප්‍රෙස් හි පී. ඒ. විජේසුන්දර මහතා සහ එම ආයතනයේ කාර්ය මණ්ඩලයටත් තුති පුදමි.

අංජලී චන්දිමා සිල්වා
ඕමානයේ ශ්‍රී ලංකා විදුහලේ දී ය.
03.07.2013

| පටුන | පිටුව |
| --- | --- |
| ආත්මාවබෝධය | 1 |
| මලේ කතාව | 3 |
| විල සහ ජල බඳුන | 4 |
| කතරට පෑයූ වෙසක් සඳ | 5 |
| උත්තම පූජා | 6 |
| අසුභවාදීනියක්දෝ මා | 7 |
| අහෝ ඛේදයකි | 8 |
| හද අසපුවේ මුනිවරයාණෙනි | 9 |
| නුඹයි පුරසඳ - විදු බිම එකළු කළ | 10 |
| දුටිමි දෙව් රුව | 12 |
| විදුබිම දෙවොලකි - ඔබ වැඩ හිඳිනා | 13 |
| ඔබයි බුදුහිමි මෙලොව මා දුටු | 14 |
| මට හමුවූ මිතුරා | 15 |
| අරුත්බර සිතුවම | 17 |
| දොඩමළු වූ සිත | 18 |
| ගල් වූ හදවත | 19 |
| ළමා දිනය | 20 |
| මිනිස්කමේ ආලෝකය | 22 |
| සෙනෙහසක මහිමය | 23 |
| නිරවුල් මනස් ඇත්තෝ | 24 |
| කියන් සකි සඳ | 25 |
| ලක් දරුවනේ | 26 |
| ජීවිතය ගීතයකි | 27 |
| ඇති හැකි සහ නැති බැරි | 28 |
| ගුරුවරියකගේ සිහින පාසල | 29 |
| අහිමි හිමි | 30 |
| මිනිස්කම හඳුනාගැනීම | 31 |
| මව් සෙනෙහස | 32 |
| හිමියනි ඔබ නැති ලොව අඳුරුයි | 33 |
| ගිනි | 34 |
| අපේ කාලයේ සිංහබාහු | 35 |
| ඔබ | 36 |
| බුදු හිමි සැබැවින් දුටුවෙද බඹදත් | 37 |
| වෙසක් සැමරුම | 38 |
| දුක අසාවිද කවුරුන් | 39 |
| දැඩුවම් ලද සිත | 40 |

# ආත්මාවබෝධය

සිතුවෙමි දිවා රෑ
පහන් සිල නිවුණේ මන්දැයි
සුළඟින් රකින්නට එය
මුවා කළ විට සළුපටින්...

සිතුවෙමි දිවා රෑ
මල පරවුනේ මන්දැයි
හොවා ගත් කල එය
පපුතුරෙහි අදරින්

සිතුවෙමි දිවා රෑ
සොඳුරු දිය දහර
සිඳුණේ මන්දැයි
එහි ජලය සුරකින්න
වේල්ලක් බැඳි පමණින්

පසක් විය මට
මගේ වරදින්
මා ඇළුම් කළ
සියලු දේ මට
අහිමි වූ බව
සනාතනිකව

පහනේ සොම් කැකුළු නොමැතිව

තනි වූ කල අඳුරේ

වැටහුණි එහි අගය මැනවින්...

මලේ සොඳුරු බව නොදැක

වැලපුණු කල දෙනෙත්

වැටහුණි එහි අගය බොහෝ සේ...

දිය දහරේ මුදු සිසිල

නොදැනුණු කල හදට

වැටහුණි එහි අගය දැඩි සේ...

ආදරය කරන්නේ නම් ඔබ

යමෙකුට හෝ යමකට

එය තිබෙන අයුරින්

තිබෙන්නට හැරිය යුතු බව

පසක් කොට දුනි මගේ සිත මට

කඳුළු අතරින් සිනාසෙන්නට...



# මලේ කතාව

නිමිත්ත : නාලිනී කොඩිකාර මහත්මියගේ පින්සලට පිං සිදුවේවා! සිතුවම් දැක්මේ වූ 'දෑතින් ද පිදෙන්නේ මල' නම් වූ සිතුවමට ලියන ලද සටහන

විල අත්හැරියොතින් නොවේද
පූජාසනය මත පූජාවන්නේ මල?

අතැර ගොස් විල

පිදුනත් පුදසුනක

හෙට දිනේ මිලින වන

මලකි මම...

අස්ථිර වූ දිවි මගේ

එකම එක දිනක් හෝ

විලේ රැකවරණ මැද

සෙනේ දියෙන් නැවී

ඒ විල සෙවනේ

රැඳී ඉන්නට

පතමි පැතුමන්...

කිළිටි වූ පුදසුනක නොකිළිටි

මලක් වී නොපිදී...

# විල සහ ජල බඳුන

විලක් තිබුණත්
දියෙන් සපිරුණු
පවස නිවුමට
නොහැකි නම් එය
කුමකට ද
මනුසත් කෙනෙකුහට;
ජල බඳුනකින්
ලැබෙන සැනසුම
විලේ ජලයෙන්
නොදේ නම් මට
විලක් දුටුවන්
කුමන පලය ද
ජල බඳුන මට
වටී හැමවිට...
උතුම් මිනිසත්
ගුණෙන් පිරිපුන්
යමෙකු අත රැඳි
ජල බඳුන දැක
නිවී සැනසෙන
සිතක් කෙළෙසද
පවිටු විල මැද
අසරණව හිඳ
පිපාසාවෙන් මිය ඇදෙන්නේ...



# කතරට පෑයූ වෙසක් සඳ

වෙසගේ සිහිල් මදනල ගත සිත රන්දා
වැලි කතරේ සිට කවි ගී පද බැන්දා
පුර සඳ පායනා විට හද කර නන්දා
බුදු තෙමඟුල් ලොව්තුරු අම සුව වින්දා

අගිල් කපුරු නෙක කුසුමන් නැතිවාට
සුවඳැති මල් පිපෙයි හදවත පුරාවට
දසත හමන සුවඳින් යුත් එමල් මිට
බුදු හිමි නමට පුද දෙමි දුරු කතර සිට

දිවි කතරේ දුක මේ යැයි පසක් කොට
බුදු හිමියනි සිතෙයි ඔබ ගිය මඟ යන්ට
ලොව්තුරු අමා සුවයක රස විඳ ගන්ට
කළ පින් මදිවදෝ මේ අත්භවේ මට

# උත්තම පූජා

භව කතර බෝ දුරක්
ඔබ සමඟ ආ බවක්
හැඟේ මට නිරතුරුව
ඒ නමුත් විඩාවක්
නොමදැනේ කිසිවිටෙක...
මේ භවේ අතරමග
කෙළවරක හමුවුවත්
තවත් යා යුතු වූ දුර
කෙටි වුවත්...
ඔබේ අසළින් හිඳින
කළණ මිතුරියම වෙමි.
දිවි මගේ සවියක්ව
සෙනෙහසේ කවියක්ව
අත්වැලක් වී නිබඳ
සදා ඔබ ළඟ රැඳෙමි
සුවඳ පිරි මලක් වී
ලොව සුවඳවත් කරන



# අසුභවාදිනියක්දෝ මා

දකින කල මා
යථාර්ථය මැනවින්
හංවඩු ගැසුවෝය
බහු දනෝ
අසුභවාදිනියකැයි මා...
මතුපිටින් පෙනෙන දෑ
සොඳුරු බව පසක් කළ
සත් වග
සුභවාදීන් විය
ජීවිතය ජයගත්
එයද සත්‍යය...
බලන් කඩතුරා
විවර කොට
ඔබ දෙනෙත් වසා ඇති...
කුමක්දැ යි ඔබ
දකින්නේ කියා...
යථාර්ථයට බිය වූ
කිසිවෙකුත්
දිනුවේ නොවෙයි ජීවිතය
සැබැවින්ම කිසි කලෙක.

# අහෝ ඛේදයකි !

සිප් කිරි පොවා සෙනෙහෙන්
දැඩි කළ මා දරුවන්
බොහෝ පව් කම් කොට
නොමග යනු දකින්නට
නොරිසියෙමි...
කළ කී සත් ක්‍රියා දැක
වෛරී වූ මිනිසුන්
අවි අමෝරා ගෙන
සටනට පිළිපන් කළ
නිරායුධ මා
පලා යන්නද ... ?
අභය ඉල්ලා
වැඳ වැටෙන්නද ... ?
නැතොත් උන් රැක
මියෙනු යෙහෙකැයි
සිතා අවියට
ගෙල පාන්නද ... ?



# හද අසපුවේ මුනිවරයාණෙනි

සොයමින් ජීවිතය
සරද්දී නේක දෙස
ජීවිතය නම් මෙයැයි
ගැඹුරු ලෙස වටහා දුන්
මහරු ඇදුරු සඳ
නුඹයි මට...
නෙතු පියන් සැලී
දුක වාන් දමන විට
යථාර්ථය පසිඳ ලූ
මුදු හදැති පියතුමන්
නුඹයි මට...
කඳුළු සයුරේ පීන පීනා
දිවි මඟ ජය ටැඹ
කරා යන්නට
නොහැකි බව පසක් කළ
මුනිවරයාණන්
නුඹයි මට...
වියළි කතරට
කෙම් බිමක් වී
බොහෝ දන
සරතැස නිවාලූ
සුමුදු මඳ නල සඳිසි
කිවිඳුන් ද
නුඹයි මට...

## නුඹයි පුරසඳ - විදු බිම එකළු කළ

පුංචි වැහි බිඳුව නුඹ
කියා දුන්නෙහිය මට
නිහඬවම...

මිනිසත් බවේ
මහ විසල් පාඩම
නුඹ වැනි වූ වැහි බිංදු
දහස් ගණනින් එක්ව
වියළි වැලි කතර
සිප ගනිද්දී අනලස්ව...

විහිළිසර සිතින් යුතු
අසරණ වූ ළමා කැල
සරද්දී නේක දෙස
හාමතින් ...

උන් අතැර නිවෙස් වෙත
යාගන්න වෙර දරන
ඇදුරු මව් පියවරුන්
දුටිමි මම...
බොඳ වූ නෙතු අතරින්...

හදපිරි සොවින් ඒ දෙස
නෙතු යොමා බලා හුන් සඳ
දුටිමි ගුරු තරු කැල
බෝසත් ගුණෙන් පිරිපුන්...



සරමින් ඔබ මොබ
රැක ගන්න දූ පුතුන්
නිවන්නට උන් කුසගිනි
දරන අපමණ වෙහෙස...

සෝකයේ තිමිර පට ඉරාගෙන
සෙනෙහසේ කඳුළු බිඳු
නෙතු අගට ගලද්දී
මදහසක් නැගුණි මුවගට
ඇදුරු තරු පිරිවැරූ
මහ ඇදුරු සඳ
දුටු සඳ...

# දුටිමි දෙවි රුව

රෝගීව අසරණව
සයනයෙහි උඩුකුරුව
වැතිර හිඳි සඳ
සෝකයෙන් මුසපත්ව...
දුටිමි මනසින්
මියෙන කෙනෙකුන්
සරණාවන්නට
කෙනෙකු නොමැතිව...
මරණයේ
සෙවනැල්ල අබියස
දෛවයේ රුදු
සිනා හඬ මැද...
මළානික නෙතු
විවර වුණු සඳ...
දුටිමි දෙවි රුව
මහදවත ඇඳි
පිහිට වන්නට
දෑත් දිගු කළ



# විදුබිම දෙවොලකි - ඔබ වැඩ හිඳිනා

ඔබ දුන් සවිබල
උදුරා ගත් කළ
කුරිරු දනන් මෙලොවේ
වැළපෙන දරු සිත්
සුවපත් කෙරුමට
නොහැක තවත් රිසිසේ...
ළමා සිතක අරුමය නාඳුනනා
මිනිස් කැලක් අතරේ
කුමක් කරන්නද
හඬා වැටෙනු මිස
අසරණ නෙත් හමුවේ...
ඔබ වැනි දෙවිවරු
ලොවේ ඇතොත් තව
මේ ලොව සුන්දර වේ...
එසේ නොමැති ලොව
විසුම දුකකි මට
සමුගෙන යනු රිසි වේ...

# ඔබයි බුදු හිමි මෙලොව මා දුටු

සෙනෙහසේ සත් පියුම් පිපිලා
ඔබේ පය පාමුල පිදෙද්දී
බුදුන් දුටුසේ හදට දැනුණේ
පෙර භවේ ඔබ හමුවු මතකයදෝ...

සැවොම එක් වී මා පෙළද්දී
බුදුන් මෙන් ඔබ පිහිට වූයේ
පෙර භවේ මා ඔබේ සෙවනේ
බවුන් වැඩු පින පහළ වීලාදෝ...

ලොවේ ගැරහුම් අසනි වැසි මැද
බියෙන් තැතිගෙන සැඟව හුන් සඳ
අමා වදනින් හද තෙමාලූ
මෙලොව මා දුටු සමිඳු ඔබ නේදෝ...



# මට හමුවූ මිතුරා

දහසක් පැතුමන්
හද දරාගෙන
ආවෙමි මම
දුරු කතර ගෙවා ගෙන
කිරි සුවඳ විහිදෙනා
මල් කැකුළු පුබුදන්නට...

පාළුව, තනිකම
මා වෙලාගෙන
තලයි මා ගත,
පෙළයි මා සිත
මේ නුහුරු වැලි කතරේ...

කඳු යායට උඩින්
නුඹ පායා එන සඳ
සිනාසීගෙන,
සබඳ! සකි සඳකි
නුඹ මට...

නේක මල් පිපෙනා
වෙසගේ අසිරිය
බුදු පා පහස ලද
ලක් දෙරණේ මහිමය
පසක් කොට දෙයි
නුඹ මට...

නෙතු පියන් සැලෙයි
හද බැති බරින් මිරිකී...
කුසුම් නොපිපෙනා
මේ රුදු මරු කතරේ
මල් සුවඳට ඉවකොට
හද සුසුමන් ඉතිරේ...
නුඹ පමණි මගේ හද
වටහා ගත් මිතුරා...
එබී බලා රහසේ
ඉඟි කොට සැඟවෙන්නා
තනිකොට මා අඳුරේ...



# අරුත්බර සිතුවම

ඔබේ දෑසේ ලියැවුණු
දයාර්ද්‍ර වූ සෙනෙහස
සිතුවමක් විය මට
මැනවින් සිත්තම් වූ ...
නෙක සිතුවිලි රටාවෙන්
නොකැළැල්,
පිවිතුරු වූ සිතුවමකි එය...
මා බොහෝ නෙත්වල සෙවූ
මට කිසිදා හමු නොවූ
සැබෑ මිතුදමේ
ආනන්දයෙන් ඔප වූ
මා දුටු සුන්දරම
අරුත්බර සිතුවම
එයයි මට,
කල්‍යාණ මිතුරියේ...
ඔබේ සුරතින්
පණ පෙවෙන සිතුවම්
දහසක නොමැති රුව ගුණ
දකිමි මම
ඔබේ නෙත් සඟළ තුළ
උතුම් මිනිසත් කමේ
පැහැයෙන් දිදුලන
අමිල සිතුවමක් ලෙස...

# දොඩමළු වූ සිත

මෙලොව මා පමණක් ම
හොඳ බව...
විසක් සේ හදවතේ රඳවා
දුෂ්ට යැයි මේ
ලොවේ අන් අය
නොසිතුවෙමි කිසිදා...
ආදරය කරුණාව හද රැඳි
බෙදා දුන්නෙමි
සැමට සැමවිට...
සෙනෙහසේ මුදු
මොලොක් බව මිස
නැත කිසිත්
වෛරී හැඟීමක්...
පිහිට වෙනු මිස
සැමට හැකි විට
නොසිතුවෙමි ගැහැටක්
කිරීමට...
වටහ ගනු බැරි
මගේ හදවත
රිදව රිදවා
සතුටු වෙන දන
දෙස බලා
කඳුළැලි පුරෝගෙන
සිතිමි මේවන්
හදවතක් ගෙන
උපන්නේ
ඇයිදැ යි කියා...



# ගල් වූ හදවත

සත්‍ය මා දෙනෙත් තුළ
සැඟව සිටිතැයි බියෙන්
බොහෝ දෙන නොබැලූහ
මගේ දෙස සෙනෙහසින් ...
වෛරයේ ගිනිදැලින්
මා දවා දමන්නට
බොහෝ දේ කළහ උන්
නොතිත් ආශාවකින් ...
නොහැකි වූ කල එයත්
ක්‍රෝධ ගිනි අවුළුවා
වෙහෙස දැරුවෝ ය උන්
මසිත ගිනි තබන්නට ...
උන් හඹා යන කිසිත්
අවැසි නැති බව මෙමට
වටහා ගත් දිනෙක උන්
හඬන්නට කඳුළු නැත
ගල්වෙලා මගේ සිත ...
පැතුවෙ නැත මා කිසිත්
මුළු ලොවට මා බෙදන
ආදරයෙ හිලව්වට.

# ළමා දිනය

දුටුවෙමි සිඟමන්
යදිනා දරුවන්
ළමා දිනේ සමරන දා
මා පිය අත්ගෙන
සතුටු සිතින්
සැරිසරන ළමා පෙළ
පරදා...

වියළි පාන් රොඩු
දිව බොජුනක් සේ
භුක්ති විඳින
දරුවන් අතරේ
නානාවිධ රස
බොජුන් සොයා යන
දරුවන් දුටුවෙමි
රිසි සේ ...

වැරහැලි ඇඳගෙන
අප යන මාවත
අත පානා දරුවන්
අතරේ ...
දෙසවන් සිරවිය
මහමග දිවයන
වාහනවල ඝෝෂා
මැද්දේ...



සිනා පොදක් නැති
මුව කමලේ ...
ලේ කඳුළක් නැති
නෙත් යුවළේ ...
මොනවද ලියැවී
ඇති බව වැටහේ
කියවන්නට පෙර
නෙත් බොඳ වේ...

# මිනිස්කමේ ආලෝකය

දුටුවෙමි විසල් එළියක්
මා ඔබේ දෙනෙත් තුළ
වටහා ගතිමි එය
මනුෂ්‍යත්වයේ එළිය බව...
නොදුටුවෙමි මේ බිමේ
කිසිදු නෙත් දෙකක් තුළ
එවන් වූ උතුම් මිනිසත් කමක්...
දයාබර බවක් හෝ ළතෙත් බව
රැඳී බවක්...
රකින්නට ඒ දෙනෙත්
මා දෙනෙත් හා සමව
වෙර දැරීම් නිබඳව
බැති පෙමින්...
නොදුටුවත් ඒ බවක්
කිසිවෙකුත්...
රුදුරු ලෙස කෝප වී
රිදෙව්වත් හදවතක්
ආදරය පෑ ඔබට
මුළු හදින්...
කඳුළකින් ඔබේ නෙත
තෙත් වුවොත් මතු දිනෙක
පිවිතුරු වු මිතු දමේ අනුහසින්...
මා නැතත් ඔබ අසළ
සිහි කරනු මැන සබඳ
ඒ උතුම් දයා සිත
සෙනෙහසින්...



# සෙනෙහසක මහිමය

සෙනෙහසක් මෙතරම්
හද ගැබෙහි
තිබුණිදැ යි නොදනිමි
රිදෙන තුරා...
ගලන්නට මෙතරම්
කඳුළු බිඳු
තිබුණිදැ යි නොදනිමි
දෙනෙත් තුළ ...
ඔබේ දෙනෙතේ
කෝප ගිනිදැල්
නැගී විත් මා
හද දවද්දී...
වේදනාවේ
කවුළු විවරව
නෙත් අගින්
ගැලුවා ගඟක් වී...
නොදුටු මුත් ඔබ
මගේ සෙනෙහස
දොස් නගනු පෙර
වදන් එක් කොට
කිසිදු වරදක්
නොකෙරුවෙමි මම
හද බැතින් ඔබ
පුදමි මතුවද...

# නිරවුල් මනස් ඇත්තෝ

මානසික යැයි කියා කොන්කර
අහිංසක සිත් තලන්නේ ඇයි ?
රෝගී උන්ම ද නැතොත් නුඹම ද
කියා මොහොතක් සිතාපන්නේ...

අවුල් මනසින් කරන කිසිවක්
නිනව් නැති මුත් කුමක් කරමුද
සෙනෙහසක් පා පිහිට වනු මිස
සිනා සි උන් පෙළනු කුමටද ?

මනස නිරවුල් උන්ම එක් වී
අවුල් කළ මුත් මනස උන්ගේ
කවුරු ඒ ගැන සිතාවිද අද
මිනිස්කම ලොව අතැර යද්දී



# කියන් සකි සඳ

පුර සඳක් සේ
පිබිද සිටි ඔබ
අඩ සඳක් වනු
මා දකිද්දී
වටහ ගන්නට
නොහැකි දුකකින්
මහද ඉකි බින්දා ...
සොම් කැකුළු දෙන
මුව කමල මත
සෝකයේ රේඛා
ඇඳෙද්දී ...
ජීවයෙන් පිරි
නෙත් සඟළ තුළ
දොම්නසේ සේයා
රැඳෙද්දී...
නෙතේ කඳුළැල්
දෝරෙ ගැලුවා
සිතේ දුක රන්දා...
කියන් සකි සඳ
කුමක් වුණිදැයි
මෙසේ සඳවත
වෙනස් වන්නට,
දරා ගන්නට
නොහැකි විලසින්
ඔබේ වන
මුකුලිතව යන්නට ...

# ලක් දරුවනේ

ලක් මව් තුරුලේ උපන්න
දූ පුතුනේ මේ අහන්න
අපේ රටේ සාරධර්ම
රැක ගන්නට සිතට ගන්න...

බටහිරකරණය කියමින්
තමන්ට ගැළපෙන්නැති දේ
එපා පුතේ වැළඳ ගන්න
කිසිවිටක කවුරුන් කීවත්...

අපේ රටේ දූ දරුවන්
සුවඳ හමන මල් වාගෙයි
ලොවම සුවඳවත් කරමින්
ලක්මව සතුටින් සනසයි...

සමගි දමින් අත්වැල් බැඳ
වාද භේද දුරු කරලමු
අපි හැම දෙන එක්සත් වී
බැතියෙන් රට දැය සුරකිමු...



# ජීවිතය ගීතයකි

එක් සොඳුරු නිමේෂෙක
පුංචි දරුවන් සමඟ
සොම්නසින් මා ගයන
සිහිනයක් දුටිමි මම...

තවත් ඒවන් දිනෙක
සිහිනයම සැබෑ විය
ගයන්නට ඔවුන් හා
හැකිවුණිය එදා සිට...

රඟන්නෙමි ගයන්නෙමි
ළමුන් හා එක්ව මම
හැඟෙයි මට ජීවිතය
ගීතයක් බව එවිට...

# ඇති හැකි සහ නැති බැරි

ඇති හැකි අය සැපසේ
රකියි උන් දූ පුතුන්
සියලු යස ඉසුරු දී
අයාලේ ගියත් උන්
නීතියේ යදම් බිඳ
නොබලයි නෙත් යොමා
මුදලින් වසයි සැමදේ
පව්කම් දෝරෙ ගලනා...
නැති බැරි අය දුකසේ
රකියි උන් දූ පුතුන්
සියලු ගුණ දම් පොවා
අකුරු කරවා මැනවින්...
රට දැයට වැඩක් ඇති
දරුවෝ බිහි කරයි උන්
ලක් මවගෙ මුව පුරා
සිනා කැන් රඳවමින්...



# ගුරුවරියකගේ සිහින පාසල

මගේ සිහින පාසල තුළ
අසමගිකම් කිසිත් නොමැත
සියලු දෙනා එකමුතු වී
ඉටුකරලයි තම සේවය

මගේ සිහින පාසල තුළ
කරදර දුක් තැවුල් නොමැත
සැමදෙනාම සිනාමුසුව
දුව පැන ඇවිදියි රිසි ලෙස

මගේ සිහින පාසල තුළ
කෙනෙකු නොරිදවයි අනිකෙකු
අන් අයගේ හැඟිම් ගැන
වැටහීමෙන් වෙසෙයි ඔවුන්

මගේ සිහින පාසල තුළ
කෙරෙන කතාබහ නිසි ලෙස
නිදහස් මනසින් සතුටින්
කෙරෙනු දැකිය හැකිය නිබඳ

මා දකිනා සිහිනය තුළ
සුරපුරයකි මගෙ පාසල
එහි සේවය කිරීම මට
සිහිනයක්ම වනු නියතය

## අහිමි හිමි

ඔබ මට හිමි නැති
බව දන්නා මුත්
සිත එය පිළිගන්නෑ
ඔබට දුකක් දී
වෙනතක යන්නට
එය ඉඩ දෙන්නෙත් නෑ...

කඳුළැල් නෙතු යුග
බොඳ කරනා මුත්
ඔබ ළඟ වැලපෙන්නෑ
මා හඬනා බව
මගෙ සිත දනිතත්
ඔබ දැන ගත යුතු නෑ...

අහිමි සිතක් ළඟ
නෙතු නැවතුන මුත්
ඒ ගැන අහිතක් නෑ
පෙර භවයක හුරු
හුරු පුරුදු බවට මිස
නෙතු නවතින්නෙත් නෑ...



## මිනිස්කම හඳුනා ගැනීම

අන් කෙනෙකුගේ දුකක් ළඟදී
ඉනුවොත් කඳුළක් දෙනෙතට
ඒ මිනිසත්කම බව ඔබ
සිතට ගත යුතුයි

කෙනෙකුගේ දුක් කරදර හැම
තමන්ගේ දුක සේ සලකා
පිහිට වීම මිනිස්කමයි
සිතට ගත යුතුයි

අසරණ කෙනෙකුට අතදී
නැගිටින්නට උදව් වීම
මිනිස්කමේ පූජාවකි
සිතට ගත යුතුයි

මිනිස්කමට වඩා වටින
දෙයක් නොමැත මේ ලොව තව
සත්‍ය එයම බව අප හැම
සිතට ගත යුතුයි

## මව් සෙනෙහස

කතරක තනිවී
දුක වළඳන විට
ඔබ ගැන සිහිවෙනවා
සිතේ තැවුල් දුක්
හටගන්නා විට
' අම්මේ ' කියවෙනවා

මව් සෙනෙහස මෙන්
අන් කිසිවක් ලොව
කිසිදා වටින්නෙ නෑ
දරු දුක හඳුනන
මවක සෙනේ ගඟ
කිසිදා සිඳෙන්නේ නෑ

ලොව නිමවන තුරු
මව් ගුණ ගැයුවත්
එය නිම කරන්න බෑ
ඔබෙ ගුණ සිහිකර
පිදුවත් නිරතුරු
අද මා ඔබ ළඟ නෑ



## හිමියනි ඔබ නැති ලොව අඳුරුයි

කවුළු පියන් පත්
නැති කුටියේ සිට
හදේ කවුළු නිති
විවර කරන් මම
බලා හිඳිමි දුර
ඈත ඉසව්වක
ඔබ එන පෙර මඟ
නෙතු දල්වා ...

රැයක් දවාලක්
නොමැති අගාධෙක
අඳුරෙහි තනි වී
සිත ඉකිලන විට
ඔබ මුමුණනු මට
ඇසුණා රහසෙන්
සෙනෙහස් හැඟුමෙන්
සිත පුරවා ...

කිසිදා නොපැතූ
දිවියක උරුමය
හිමිකර දී මට
බලා හිඳින්නේ
කිමද දෙවිඳුනේ
කිව මැන මා හට
දරාගන්න බෑ
මේ රුදු පාළුව ...

# ගිනි

හාමතින් ඉකිබිඳින
දියණියගේ සුසුම් හඬ
ළය මඬල සිදුරු කොට
හද පුරා ගලන විට
රාග ගිනි ඇවිලෙනා
ඔබෙ අඳුරු කුටිය වෙත
පිය නැඟුවේ සෙනෙහසින්
නම් නොවේ පිය සබඳ ...
අහර බිඳකුදු නොදුටු
ඇකිළ ගිය කුස පොත්ත
කිරට හඬමින් මියෙන
සොඳුරු තන හස යුවළ
ඔබේ රස නහරවැල්
පණ පොවන මුත් සැණින
දියණියගෙ කඳුළු වැල්
ගලා යන මුව මඬල
මගේ ලේ නහරවැල්
කකියවන බව නිබඳ
වටහ ගනු මැන මෙතින
මා වැනිම වයසෙ වූ
ඔබෙ දියණි දෙස බලා ...



# අපේ කාලයේ සිංහබාහු

පියකරු වූ මා පියඹ
තනිකර දමා ලෙන තුළ
ගියෙමි රුදු වනයට
රස ඵල නෙලන් එන්නට...
වනයෙහි සරා හැමතැන
විඳ දුක් ගැහැට අපමණ
පැමිණි සඳ මා ලෙනට
නික්ම ගොසිනි ඇය
පෙරළා නොඑන්නට
ලෙන් දොර හැර පියා...

# ඔබ

ගවර පිරි ගොවුදෙක
සුපිපි සුදු නෙළුම ඔබ
ගුණ දහම් පිණි දියෙන්
නැහැවෙමින් සුදිලෙන...

ඝන අඳුරු අහස් කුස
දිලෙන තනි තරුව ඔබ
සුවහසක් තාරකා
පරයමින් එළිය දෙන...

මරු කතර තෙමා වට
මහා වරුසාව ඔබ
ගිනියම් වූ මහ පොළව
සිසිලසින් පණ පොවන...



# බුදුහිමි සැබැවින් දුටුවෙද බඹදත්

ගැයුවේ බඹදත්
බුදුන්ගේ ගුණ
නොදැන වුව
ඒ සමිඳු ගුණ කඳ
සෙනෙහසයි
නොදුටුවේ බුදුහිමි
බ්‍රහ්මදත්තගේ
හදවතේ පිරි
''කුමක් මා ගැන
දැනද බඹදත්
ගයන්නේ ගුණ
ගායනා මගෙ''
අසාවිද ඒ
අයුරු කිසිවිට
දුටුවෙ නම්
බඹදත්ගෙ සෙනෙහස
බුදුන් වෙත පෑ
අමිල සෙනෙහස ...

## වෙසක් සැමරුම

සිතිවිලි අතරේ සිරවී දවස ගෙවෙනවා
ගිනිගත් කතරේ සිට හදවත් ළතවෙනවා
කියා ගන්න බැරි දුක පන්හිඳට කියනවා
පන්හිඳ ඒ දුක පත්ඉරු පුරා ලියනවා

වෙසක් මහේ අසිරිය මුදු හදට දැනෙනවා
අවිහිංසක සිතිවිලි සිත පුරා දුවනවා
පුංචි කුටියෙ තනිවූ සිත කඳුළු සලනවා
පුර හඳ පමණක් තනියට ළඟින් ඉන්නවා

අගිල් කපුරු මල් සුවඳක් සිතට දැනෙනවා
සිත සනසන පන්සල නෙත් පුරා ඇඳෙනවා
හද බුදු හිමි ළඟ තබලා බවුන් වඩනවා
කඳුළු මල් පුදා බුදුහිමියන් නමදිනවා



## දුක අසාවිද කවුරුන්

දුක සඳට කියන්නම්
සඳ එය අසා සිටී නම්
දුක හිරුට කියන්නම්
හිරු එය අසා සිටී නම්
දුක ඔබට කියන්නම්
ඔබ එය අසා සිටී නම්
සිත සනසන වදනක් හෝ
මුවින් නැගේ නම්

තරු දහසක් මැද දිලෙනා
තරුවක් තනිවුණේ කොහොමද ?
දහසක් කුසුමන් මැද පිපි
කුසුමක් තනිවුණේ කොහොමද ?

සොඳුරු සිනාවෙන් සපිරුණු
වත අඳුරින් වැසුනේ කොහොමද ?
කැළුම් දිදී බැබළුණ නෙතු
කඳුලින් බොඳ වුනේ කොහොමද ?

# දැඩුවම් ලද සිත

පැතුමන් මියැදී සිත ගිනි ඇවිලී
දුක දෝරෙ ගලා ඉතිරී
හැඟුමන් වියැකී සිතිවිලි විසිරී
හද තැලී පෙළී වැතිරී

නිහඬව ඉකිබිඳ වැළපෙන සිතිවිලි
අසරණ වූ නෙතු අගින් ගලයි
ඇති තතු ඒ ලෙස පැවසූ වරදට
ලද දැඩුවම් හද දැදුරු කරයි

පිවිතුරු හදකින් යහ සිතිවිල්ලෙන්
කරනා දෙය ලොව පුබුදු කරයි
කෙනෙහිලිකම් මැද බවුන් වඩන්නට
ඒ සිත සවිමත් වුණෝ එදයි

වටහා ගනු බැරි අවිහිංසක සිත
තලා පෙළා රිදවනු එමටයි
බුදු මැදුරක පුදසුනක තබා වුව
පුදන්න හැකි එය සුපිරිසුදුයි